සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
## Practice Test - Grade 13 - 2022

**බෞද්ධ ශිෂ්ටාචාරය - I** **45 S I**

කාලය: පැය දෙකයි

උපදෙස්:-
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1 සිට 50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ **ඉතාමත් ගැළපෙන පිළිතුර** තෝරාගෙන එය **පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×)** යොදා **දක්වන්න.**

01. බ්‍රාහ්මණයන් විසින් චතුර්වර්ණය සමාජගත කිරීමේ දී ආර්ය අනාර්ය භේදය ද සැලකිල්ලට ගෙන ඇති බවක් දක්නට ලැබේ. ඒ අනුව ආර්ය ගණයට ඇතුළත් වන්නේ,
   (1) බ්‍රාහ්මණයන් පමණි. (2) ක්ෂත්‍රියන් පමණි.
   (3) බ්‍රාහ්මණයන් හා ක්ෂත්‍රියන් පමණි. (4) බ්‍රාහ්මණ ක්ෂත්‍රිය වෛශ්‍ය වර්ණ පමණි.
   (5) බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන අය පමණි.

02. බ්‍රහ්ම සහව්‍යතාව අපේක්ෂාවෙන් අනගාරික ව හුදකලා සංචාරක ජීවිතයක් ගත කිරීම නිර්දේශ වූයේ,
   (1) තාපසවරුන්ට ය. (2) පූජකවරුන්ට ය. (3) ආරණ්‍යගත වූවන්ට ය.
   (4) වානප්‍රස්ථ අවධියට පත් වූවන්ට ය. (5) සන්‍යාස අවධියට පත් වූවන්ට ය.

03. බුදු දහම කිසිවිටෙකත් අභිනිෂ්ක්‍රමණය සඳහා නීති පනවා නැත. එය ස්වකැමැත්තෙන් ම ලෝකයේ යථා ස්වභාවය මැනවින් තේරුම් ගෙන ක්‍රියා කළ යුත්තක් බව බෞද්ධ ඉගැන්වීම වේ. මෙම බෞද්ධ ඉගැන්වීම් තුළින් බැහැර කරන බ්‍රාහ්මණ ආගමික සංකල්පය කුමක් ද?
   (1) වර්ණ ධර්ම සංකල්පය (2) ස්වධර්ම සංකල්පය (3) ආශ්‍රම ධර්ම සංකල්පය
   (4) ආපද් ධර්ම සංකල්පය (5) යාග කර්ම පිළිබඳ සංකල්පය

04. බුදුරජාණන් වහන්සේ කාන්තාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරලීමට අදාළ ව ඉදිරිපත් කළ ඉගැන්වීම් ඇතුළත් සූත්‍ර ධර්මයක් නො වන්නේ මින් කුමක් ද?
   (1) සාමඤ්ඤඵල සූත්‍රය ය. (2) මහා පරිනිබ්බාණ සූත්‍රය ය. (3) සත්තභරිය සූත්‍රය ය.
   (4) ධීතු සූත්‍රය ය. (5) සිගාලෝවාද සූත්‍රය ය.

05. මසුන්ට අටවන ලද කෙමිණ මසුන්ට විපත්තිදායක වන පරිද්දෙන් මිනිසුන්ට අනර්ථකාරී වන බව බුදුරජාණන් වහන්සේ දේශනා කරනු ලැබුවේ, කිනම් ශාස්තෘවරයෙකුගේ දර්ශනයක් සම්බන්ධයෙන් ද?
   (1) පූර්ණ කස්සපගේ දර්ශනය සම්බන්ධයෙන් ය.
   (2) මක්ඛලි ගෝසාලගේ දර්ශනය සම්බන්ධයෙන් ය.
   (3) අජිත කේශකම්බලගේ දර්ශනය සම්බන්ධයෙන් ය.
   (4) සංජය බෙල්ලට්ඨිපුත්තගේ දර්ශනය සම්බන්ධයෙන් ය.
   (5) පකුධකච්චායනගේ දර්ශනය සම්බන්ධයෙන් ය.

06. ශ්‍රමණ සම්ප්‍රදායට අයත් ලක්ෂණ ගණනාවක් පහත දැක්වේ.

A පුද්ගල ස්වාමිත්වය අගය කළ පිරිසක් වීම.

B අටලෝදහමින් කම්පා නොවන පිරිසක් වීම.

C කාන්තා නිදහස අගය කළ පිරිසක් වීම.

D චින්තන නිදහස අගය කළ පිරිසක් වීම.

E බ්‍රහ්ම චර්යාව හා අනගාරික ප්‍රතිපදාව පිළිගත් පිරිසක් වීම.

ඉහත ප්‍රකාශ අතුරෙන් බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායට පමණක් අනන්‍ය වූ ලක්‍ෂණ දක්නට ලැබෙනුයේ,

(1) Aවල පමණි. (2) A සහ Bවල පමණි. (3) A B සහ Cවල පමණි.

(4) A B C සහ Dවල පමණි. (5) A B C D සහ E යන සියල්ල ම ය.

07. වාණිජකරණය හා නාගරීකරණය භාරතීය ආර්ථික හා සමාජීය ක්ෂේත්‍රයන්හි බොහෝ පරිවර්තනයන් උදාකරදීමට හේතු විය. පහත දැක්වෙන්නේ එයින් කිහිපයකි. ඒ පරිවර්තන කාර්යයට අයත් නොවන්නේ මින් කුමක් ද?

(1) වර්ණ ධර්ම මත ගොඩනැගී පැවති සමාජ ස්ථරයන්ගේ පරිවර්තනයක් ඇති වීම.

(2) පාලකවරුන්ට පවා අභියෝග කළ හැකි නව ධනපති පන්තියක් බිහි වීම.

(3) සමාජය තුළ ඇති නැති පරතරය වඩාත් ව්‍යාප්ත වීම.

(4) අල්ලස, දූෂණය, ගණිකා වෘත්තිය වඩාත් ප්‍රබල ව පැවතීම.

(5) හුවමාරු මාධ්‍යයක් ලෙස භාණ්ඩ හුවමාරුව වඩාත් ප්‍රචලිත වීම.

08. බරණැස් නුවර .................... ජනපදයේ අගනුවර විය.

(1) අංග (2) මගධ (3) කාසි (4) කෝසල (5) ගන්ධාර

09. පහත දැක්වෙනුයේ නව අරහාදී බුදුගුණවලට අදාළ වූ එක් එක් බුදු ගුණයන්ට ඇතුළත් සුවිශේෂී ගුණයන් කිහිපයකි.

A දැනගතයුතු සියලු ධර්මයන් දැනගෙන අවබෝධ කර කරගත් නිසා

B සියලු කෙලෙසුන් දුරු කළ නිසා

C ශෝභමාන වූ ගමන් ඇති නිසා

D සංසාර චක්‍රයෙහි සියලු ගරාදි නැසූ නිසා

E වැඩිය යුතු සියලු ධර්ම වැඩූ නිසා

මෙම ගුණාංගයන් තුළින් **අරහං** යන ගුණයට ඇතුළත් වන්නේ,

(1) A සහ B පමණි. (2) A සහ E පමණි. (3) B සහ E පමණි.

(4) B සහ D පමණි. (5) C සහ පමණි.

10. **'තුන් ලොව තතු ලෙසට - දැනගෙන නොදත් මෙලොවට**

**දෙසුයෙන් නියමකොට - .................... '**

යනාදී පද්‍යයෙන් විස්තර වන බුදු ගුණය කුමක් ද?

(1) ලෝකවිදූ ගුණය (2) විජ්ජාචරණ ගුණය (3) සම්මා සම්බුද්ධ ගුණය

(4) අරහං ගුණය (5) බුද්ධ ගුණය

11. මජ්ඣිම නිකායේ මහා සීහනාද සූත්‍රයේ දැක්වෙන පරිදි බුද්ධ ශරීරය කොතරම් දුර්වල වුවත් කිසිදු ආකාරයකින්වත් හීන නොවන බව බුදුරදුන් දේශනා කරනු ලැබුවේ උන්වහන්සේගේ,

(1) මහා කරුණාවයි. (2) මහා ප්‍රඥාවයි. (3) මහා මෛත්‍රියයි.

(4) උපාය කෞශල්‍ය ඥානයයි. (5) චතුර් වෛශාරද්‍ය ඥානයයි.

12. බුදු රජාණන්වහන්සේ ධර්ම දේශනා කිරීමේ දී තම ශ්‍රාවක පිරිසට මැනවින් එය අවබෝධවන ලෙසට දේශනා කළහ. ඒ අනුව ධර්ම දේශනා කිරීමේ දී ශ්‍රව්‍ය දෘශ්‍ය උපකාරක අවස්ථා යොදාගත් බවට නිදසුනකි.

(1) කිසාගෝතමියට ධර්මය දේශනා කිරීම සඳහා යොදාගත් ක්‍රමවේදය.

(2) කසීභාරද්වාජ බ්‍රාහ්මණයාට ධර්මය දේශනා කිරීම සඳහා යොදාගත් ක්‍රමවේදය.

(3) අංගුලිමාලට ධර්මය දේශනා කිරීම සඳහා යොදාගත් ක්‍රමවේදය.

(4) පස්වග මහණුන්ට ධර්මය දේශනා කිරීම සඳහා යොදාගත් ක්‍රමවේදය.

(5) නන්ද හිමියන්ට ධර්මය දේශනා කිරීම සඳහා යොදාගත් ක්‍රමවේදය.

13. **"ඇතුන් සිය දහසක්, අසුන් සිය දහසක්, වෙළඹුන් සිය දහසක්, රථ සිය දහසක් හා මැණික් කුණ්ඩලාභරණවලින් සරසන ලද කන්‍යාවන් සිය දහසක් දක්නට යන්නාගේ පියවර සීයක් බුදුරදුන් දක්නට යන්නහුගේ එක් පියවරක්, සොළොස් කලාවෙන් කලාවක්වත් නොවන්නේ ය."** යනුවෙන් බුදුරදුන් පිළිබඳ ව ඇගයීමක් කරනු ලැබුවේ,

(1) කොසොල් මහරජතුමන් විසිනි. (2) සෝණදණ්ඩ බ්‍රාහ්මණයා විසිනි.
(3) කොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේ විසිනි. (4) පිලෝතික පරිබ්‍රාජක විසිනි.
(5) සුදත්ත සිටුවරයා විසිනි.

14. පහත සඳහන් ප්‍රකාශ අතර වැරදි ප්‍රකාශ කිහිපයක් ඇත.

A විශාඛා මහෝපාසිකාව සොළොස් වසරක් තිස්සේ ගෘහස්ථ බ්‍රහ්ම චර්යාව ආරක්ෂා කළා ය.
B ඛේමා තෙරණිය සෝවාන් ඵලයට පත්වූයේ මහා නිධාන සූත්‍රය ඇසීමෙනි.
C චිත්ත ගෘහපතිතුමා අනාගාමී උපාසකතුමෙක් විය.
D ආනන්ද තෙරුන් වහන්සේ වේදනා පරිග්ගහ සූත්‍රය ඇසීමෙන් රහත් ඵලය ලැබූහ.
E අනේපිඬු උපාසකතුමා දන්දීමේ ඇලුණු උපාසකවරුන් අතර අග තනතුර ලැබුවේ ය.

(1) A, B සහ Dවල ය. (2) B, C සහ Dවල ය. (3) A, C සහ Dවල ය.
(4) B, C සහ Eවල ය. (5) C, E සහ Eවල ය.

15. නකුලමාතා හා නකුල පිතා ගතකළ යුගදිවිය බුදුරදුන්ගේ පැසසුමට ලක්විය. එසේ වීමට ඔවුන් දෙදෙනා තුළ සුවිශේෂී ගුණ ධර්ම හතරක් සමාන ව පැවැතියේ ය. සමජීවී සූත්‍රයේ ද සඳහන් එම ගුණධර්ම හතර වන්නේ,

(1) සද්ධා, සීල, හිරි, ඔත්තප්ප (2) සද්ධා, සීල, සති, පඤ්ඤා (3) සද්ධා, සීල, චාග , පඤ්ඤා
(4) සද්ධා, සති, සමාධි, පඤ්ඤා (5) සද්ධා, සීල, සති, සමාධි

16. සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ ව අග්ගඤ්ඤ සූත්‍රයේ දැක්වෙන හේතුඵලවාදී ඉදිරිපත් කිරීමට විවිධ සාධක බලපා ඇත. ඒ සඳහා ඍජු බලපෑමක් සිදු නොකරන සාධකය වන්නේ,

(1) භූගෝලීය සාධක (2) ආර්ථික සාධක (3) දේශපාලනික සාධක
(4) ආචාර විද්‍යාත්මක සාධක (5) මනෝ විද්‍යාත්මක සාධක

17. සමගි සුබසාධක සංගමයේ වසර කිහිපයක් සභාපති ධූරය හෙබ වූ දයාරත්න මහත්මා වාර්ෂික මහා සභාවේ දී තම නිලකාලය අවසන් ව එම ධූරයෙන් සමුගන්නා මෙහොතේ කළ කතාවෙන් කොටසක් පහත දැක්වේ.

**"මම සභාපති ධූරය හෙබ වූ මේ කාලයේ දී කිසිවිටෙකත් අත්තනෝමතික ව වැඩ කළේ නැහැ. නිතර ම වැඩිහිටියන්ගේ හා දැනුම් තේරුම් ඇති අයගෙන් උපදෙස් ගත්තා. සමිතියේ වත්කම් පාලනය හා පිරිස් පාලනය සිදු කළේ ව්‍යවස්ථාවට අනුකූලව ම යි. කිසිවිටෙකත් එම නීතිරීති උල්ලංඝනය කරමින් කටයුතු කිරීමට පෙලඹුනේ නැහැ. වාර්ෂික ව අපි විවිධ දානමානාදී පිංකම් කළා. දුගී පවුල් සඳහා විවිධ පරිත්‍යාගයන් සිදු කළා. පූජනීය ස්ථාන නඩත්තු කිරීම් සඳහාත් සමිතියේ සියලු දෙනා ම සහභාගි කරවාගෙන විවිධ වැඩසටහන් කළා. ඒ වගේ ම මට ඇති ලොකු ම සතුට තමා සමගි සම්පන්න ව අද දක්වා මේ නිලයේ කටයුතු කිරීමට හැකියාව ලැබීම. සමිතිය රැස් වූ මොහොතේ පටන් අවසන්වන තුරු ම සමගි සම්පන්න ව සාකච්ඡා කොට තීන්දු තීරණ ගෙන විසිර යාමට හැකියාව ලැබීම."**

"ආදී වශයෙන් සමිතියේ උන්නතිය සඳහා කළ සේවාවන් ඉදිරිපත් කළේ ය. ඔහුගේ මෙම කතාව තුළ සප්ත අපරිහානීය ධර්මවලට අදාළවන කාරණා ගණනාවක් ද දැක්වේ. ඒ සංඛ්‍යාව කොපමණ ද?

(1) තුනකි. (2) හතරකි. (3) පහකි. (6) හයකි. (5) හතකි.

18. රටවැසියන්ගේ ආරක්ෂාව හා රැකවරණය පමණක් නොව ආර්ථික සංවර්ධනයත් රටේ අපරාධ මර්දනයත් සාමය හා සංහිඳියාවත් රාජ්‍යයක සංවර්ධන ඉලක්ක ජය ගැනීමට ඍජුව ම බලපායි. එසේ ම පාලකයා අත්තනෝමතික ව අගතිගාමී තීරණ ගැනීමෙන් රටට සිදුවන හානිය වළක්වා ගැනීමට මදයෙන් හා ප්‍රමාදයෙන් තොර පූජනීය විශාරදයන්ගේ අවවාද අනුශාසනා ලබාගත යුතු ය. මෙම ඡේදයේ අන්තර්ගත බෞද්ධ දේශපාලන මූලධර්මය ලෙස හඳුනාගත හැක්කේ,

(1) දස සක්විතිවත යි. (2) පංච සීල ප්‍රතිපදාව යි. (3) දසරාජ ධර්මය යි.
(4) සප්ත අපරිහානීය ධර්මය යි. (5) සතර අගතියෙන් තොරවීම යි.

19 සමාජ සංවර්ධනයක් අපේක්ෂා කරන පාලකයෙකු විසින් අනුගමණය කළයුතු මූලික බෞද්ධ ප්‍රතිපදාවක් ලෙස ...................................... දැක්විය හැකි ය.

(1) මැදුම් පිළිවෙතින් යුක්ත වීම. (2) සතර කර්ම ක්ලේශවලින් යුක්ත වීම.
(3) ආජීව අෂ්ටමක සීලය අනුගමනය කිරීම. (4) පංච සීල ප්‍රතිපදාව අනුගමනය කිරීම.
(5) සප්ත ආර්ය ධනය අනුගමනය කිරීම.

20. **"හිංසනය වනාහි මිනිස්කමට නොගැළපෙන නපුරු විපාක ලබාදෙන පාප ක්‍රියාවකි. අප වගේ ම ලෝකයේ සිටින සියලු ම සත්ත්වයෝ දඬුවමට, මරණයට බියවේ. දුකට අකමැති ය. සැපවිඳීමට කැමති ය. ඒ නිසා අප තුළ ඇති මේ ආකල්පයෙන් සියලු සත්ත්වයන් දෙස බැලිය යුතු ය. මේ අවබෝධය ඇති අය අනුන්ට හිංසා කිරීමටවත් අනුන් නැසීමටවත් හිතන්නේ නැත"**. මේ කථාවෙන් කියවෙන බෞද්ධ සදාචාර මූලධර්මය හඳුන්වන්නේ,

(1) ධම්මාධිපතෙය්‍ය වශයෙනි. (2) අත්තාධිපතෙය්‍ය වශයෙනි.
(3) ලෝකාධිපතෙය්‍ය වශයෙනි. (4) පරාර්ථ චර්යාව වශයෙනි.
(5) අත්තූපනායික ධම්ම පරියාය වශයෙනි.

21. **"නතං කම්මං කතං සාධු ........ "** යන ගාථාවට අනුව හොඳ - නරක විනිශ්චයට අදාළ වැදගත් නිර්ණායකයක් ඉදිරිපත් කෙරේ. එම නිර්ණායකය කුමක් ද?

(1) කිසියම් ක්‍රියාවක් කිරීමෙන් අනිෂ්ට විපාක ලැබේ නම් එය නරක බවයි.
(2) තමන් විසින් ප්‍රත්‍යවේක්ෂා කොට බැලීම තුළින් හොඳ - නරක විනිශ්චයට එළඹිය හැකි බවයි.
(3) අධිපති ධර්මවලට අනුකූල ව හොඳ - නරක විනිශ්චයට එළඹිය හැකි බවයි.
(4) අත්තූපනායික ධර්මවලට අනුකූල ව හොඳ - නරක විනිශ්චයට එළඹිය හැකි බවයි.
(5) නුවණැත්තන්ගේ ගර්හාවට හා ප්‍රශංසාවට ලක්වීම සැලකිල්ලට ගෙන හොඳ - නරක විනිශ්චයට එළඹිය හැකි බවයි.

22 පුද්ගලයෙක් වචනය භාවිත කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ව වැදගත් උපදේශයක් බ්‍රහ්මජාල සූත්‍රයෙහි දැක්වේ. එහි දැක්වෙන ආකාරයට වචන භාවිත කළ යුත්තේ, **"බිඳුණු පිරිස් එක් කිරීම සඳහා ය. එක් වූවන්ගේ සමගිය වැඩිකිරීම සඳහා ය. සමගිය උදාකරලීමට අදාළ වචන භවිත කිරීම සඳහා ය."** යනුවෙන් දැක්වෙන මෙම ඉගැන්වීම වඩාත් වැදගත් වන්නේ,

(1) සත්‍ය වචන කතා කිරීම සම්බන්ධයෙනි.
(2) කනට මිහිරි වචන කතා කිරීම සම්බන්ධයෙනි.
(3) කේලම් කීමෙන් වැළකීමට අදාළ වචන කතාකිරීම සම්බන්ධයෙනි.
(4) පරුෂ වචන කීමෙන් වැළකීමට අදාළ වචන කතාකිරීම සම්බන්ධයෙනි. .
(5) හිස්වචන කීමෙන් වැළකීමට අදාළ වචන කතාකිරීම සම්බන්ධයෙනි.

23. ශ්‍රද්ධාවන්තයෙකු තුළ දක්නට ලැබෙන ලක්ෂණ හතරක් පහත දැක්වෙන වර්ණවල සඳහන් වේ. එම ලක්ෂණ හතරට අදාළ නොවන වරණය තෝරන්න.

(1) ධර්මය ඇසීමට කැමැතිවෙයි. (2) සිල්වතුන් දැකීමට කැමැතිවෙයි.
(3) වතාවත්වල යෙදීමට වැඩි අවධානයක් යොමු කරයි. (4) සීලවන්ත අයෙක් වෙයි.
(5) මසුරු බවින් තොර ත්‍යාගශීලි අයෙක් වෙයි.

24. පහත සඳහන් ප්‍රකාශන හොඳින් කියවන්න. එම ප්‍රකාශනවලින් ඇතැම් ඒවා නිරවද්‍ය වන අතර ඇතැම් ඒවා සාවද්‍ය වේ.

A **"අර්ථචර්යාව"** යනු තමන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකරනු ලබන ක්‍රියාවන් ය.
B **"දේව ධර්ම"** යනුවෙන් දැක්වෙනුයේ හිරි ඔතප් දෙකයි.
C සතර සංග්‍රහ වස්තු "**චතු අප්පමඤ්ඤා"** යනුවෙන් ද ව්‍යවහාර කෙරේ.
D උතුම්ම ඥාතියා "**සන්තුට්ඨීය"** බව දහමෙහි විස්තර වේ.
E නීති ගරුකත්වයට අදාළ උපදේශයක් **සප්ත අපරිහානීය** ධර්මවල දැක්වේ.

මේවායින් නිරවද්‍ය ප්‍රකාශන ඇතුළත් වනුයේ,

(1) A, C, Dවල ය. (2) C, D, Eවල ය. (3) B, C, Ejල ය.
(4) A, B, Eවල ය. (5) B, D, Eවල ය.

25. බුදුරජාණන් වහන්සේ **වනරෝපා සූත්‍රය** දේශනා කරනු ලැබුවේ .................. බව සඳහන් වේ.

(1) භික්ෂූන් අරබයා (2) සක්දෙව් රදුන් අරබයා (3) පංචසිඛ අරබයා
(4) එක්තරා දෙවියෙක් අරබයා (5) කොසොල් රජු අරබයා

26. සිගාලෝවාද සූත්‍රයේ **"ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය"** යන සූත්‍ර පාඨයෙන් සම්පත් කළමනාකරණය පිළිබඳ වටිනා ධර්මෝපදේශයක් ඉදිරිපත් කෙරේ. එහි දැක්වෙන උපදේශයට අනුව සමාජ යුතුකම් ඉටුකිරීම සඳහාත් දෙමව්පියන් පෝෂණය කිරීම සඳහාත්, දන්දීම ආදිය සඳහාත් යෙදවිය යුත්තේ,

(1) ආයෝජනය සඳහා වෙන්කරන ලද කොටස්වලිනි.

(2) පරිභෝජනය සඳහා වෙන්කරන ලද කොටස්වලිනි.

(3) ආපදාවක දී ගැනීම සඳහා වෙන්කරන ලද කොටස්වලිනි.

(4) තමන්ට අභිමත ඕනෑම කොටසකිනි.

(5) යුතුකම් ඉටුකරලීම සඳහා ම වෙන්කරන ලද කොටස්වලිනි.

27. දිළිඳුකම කාමභෝගී ගිහියාට දුකක් බව උගන්වන බුදුසමය ධාර්මික ධනෝපායන මාර්ගවලින් ආර්ථික සමෘද්ධිය උදාකර ගැනීම ගෘහස්ථ ජීවිතයකට අත්‍යවශ්‍ය සාධකයක් ලෙස අවධාරණය කරයි. එය සොම්නසට හේතුවන්නක් ලෙස ද දක්වාලයි. මෙම ආර්ථික සමෘද්ධිය පැහැදිලි කිරීම සඳහා වඩාත් ම සුදුසු පාරිභාෂිත වචනය වන්නේ,

(1) උට්ඨාන සම්පදාව යි. (2) අත්ථි සුඛය යි. (3) භෝග සුඛය යි.

(4) අනණ සුඛය යි. (5) සමජීවිකතාව යි.

28. දැහැමි රැකියාවක යෙදී උත්සාහයෙන් ධන සම්පත් උපයා ගනිමින් ධනවතෙකු වීමට බුදුදහමින් බාධාවක් නැත. එසේ කිරීමේ දී **තුලාකූට, මාන කූට, කංස කූට, උක්කෝටන, වංචන** ආදී අධාර්මික ක්‍රමවලින් වැළකිය යුතු බව නිර්දේශ කොට ඇත. මේ ඉගැන්වීමෙන් අදහස් කොට ඇත්තේ,

(1) වෙළඳාම් කටයුතු ධාර්මික ව කළ යුතු බවයි.

(2) පංචවිධ අධාර්මික වෙළඳාම්වලින් වැළකිය යුතු බවයි.

(3) වෙළඳාම මෙන් ම වෙනත් දැහැමි රැකියාවකින් මුදල් ඉපයීම බුදුසමය අනුමත කරන බවයි.

(4) දැහැමි ව එහෙත් ලාභ ලැබීමේ පරමාර්ථයෙන් ම වෙළඳාම් කළ යුතු බවයි.

(5) කෘෂිකර්මාන්තය ආදී දැහැමි රැකියාවක නිරතවීම සමාජ සේවයක් ලෙස සලකා සිදු කළ යුතු බවයි.

29. පහත දැක්වෙනුයේ භෝග විනාශ මුඛ හයට අදාළ ආදීනවයන්ගෙන් කිහිපයකි.

A මිතුරන්ගේ අප්‍රසාදයට ලක්වේ. B ප්‍රඥාව දුර්වල වේ.

C තමාගේ ආරක්ෂාව නැති වේ. D තමා සාහසිකයන්ගේ මිතුරෙක් වේ.

E විවාහයට නුසුදුස්සෙක් වේ. F සමාජය ඔහුගේ වචනය නොපිළිගනී.

මෙම ආදීනව අතරින් සූදුවෙහි ආදීනව දැක්වෙනුයේ,

(1) A, C, Dවල ය. (2) A, B, Cවල ය. (3) C, D, Eවල ය.

(4) B, D, Eවල ය. (5) A, E, Fවල ය.

30. සිගාලෝවාද සූත්‍රයෙහි සදිසා නමස්කාරයට අදාළව ම දැක්වෙන යුතුකම් හා වගකීම් හැට එක අතර පරම්පරාවෙන් උරුමවන සම්පත් රැකගැනීම .......................... වගකීමකි

(1) දරුවන්ගේ (2) සේවකයන්ගේ (3) බිරිඳගේ

(4) ස්වාමිපුරුෂයාගේ (5) ශිෂ්‍යයන්ගේ

31. **"තමාට හැකියාව තිබියදී මහලුව ජරාවට ගිය මව හෝ පියා හෝ පෝෂණය නොකරයි ද? එය පිරිහීමට හේතුවකි."** යන අදහස ඉදිරිපත් කෙරෙන පරාභව සූත්‍රයේ ඇතුළත් සූත්‍රපාඨය දැක්වෙනුයේ,

(1) **"පහූත වීත්තෝ පුරිසෝ ......"** යනුවෙන් දැක්වෙන සූත්‍රපාඨයෙහි ය.

(2) **"යෝ මාතරං වා පිතරංවා ......"** යනුවෙන් දැක්වෙන සූත්‍රපාඨයෙහි ය.

(3) **"සුවිජානෝ භවං හෝති ......"** යනුවෙන් දැක්වෙන සූත්‍රපාඨයෙහි ය.

(4) **"අසන්තස්ස පියාහොන්ති ......"** යනුවෙන් දැක්වෙන සූත්‍රපාඨයෙහි ය.

(5) **"යෝ බ්‍රාහ්මණං වා සමණං වා ......"** යනුවෙන් දැක්වෙන සූත්‍රපාඨයෙහි ය.

32. සුත්ත නිපාතයේ ඇතුළත් මංගල සූත්‍රයෙහි සඳහන්,
**"ආරති විරති පාපා - මජ්ජපානා ච සඤ්ඤමෝ**
**අප්පමාදෝ ච ධම්මේසු - ඒතං මංගල මුත්තමං"** යන සූත්‍ර කොටසෙහි ඇතුළත් මංගල කරුණු නිවැරදි ව දැක්වෙන වරණය වන්නේ,

(1) සුදුස්සාට ගරුකිරීම, පාපයෙන් වැළකීම, යටහත් පැවැතුම් ඇති බව යන්න ය.
(2) සුදුස්සාට ගරුකිරීම, මත්ද්‍රව්‍යවලින් වැළකීම, යටහත් පැවැතුම් ඇති බව යන්න ය.
(3) පාපයෙන් වැළකීම, යටහත් පැවැතුම් ඇති බව, ලද දෙයින් සතුටුවීම යන්න ය.
(4) පාපයෙන් වැලකීම, මත්ද්‍රව්‍යවලින් වැළකීම, ධර්මයෙහි අප්‍රමාද වීම යන්න ය.
(5) පාපයෙන් වැළකීම, සෝක රහිත බව, ධර්මයෙහි අප්‍රමාද වීම යන්න ය.

33. **"න භජෙ පාපකේ මිත්තේ - න භජෙ පුරිසාධමේ ..."** යන ධම්ම පද ගාථාව බුදුරජාණන් වහන්සේ දේශනා කරනු ලැබුවේ,

(1) චිත්ත ගෘහපති අරබයා ය. (2) ඡන්න තෙරුන් අරබයා ය. (3) මඝ මානවක අරබයා ය.
(4) කුම්බඝෝෂක අරබයා ය. (5) මට්ටකුණ්ඩලී අරබයා ය.

34. කොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේ .......................... ප්‍රදේශයට වැඩමකොට ඥාති වර්ගයා ඇතුළු ප්‍රදේශවාසීන් සසුන්ගත කිරීමට කටයුතු කළහ.

(1) සුනාපරන්ත (2) සුංසුමාරගිරි (3) දෝණවත්තු
(4) කේසපුත්ත (5) කක්කරපත්ත

35. දෙවන ධර්ම සංගායනාවට තුඩුදුන් දසවස්තුව විනිශ්චය කිරීමට පත්කළ උබ්බාහිකාවට තෝරා ගැනුණු රහත් භික්ෂූන් වහන්සේලාගෙන් කිහිපදෙනෙක් පහත දක්වේ.

A කාකණ්ඩපුත්‍ර යස තෙරුන් වහන්සේ B ඛුජ්ජසෝභිත තෙරුන් වහන්සේ
C සබ්බකාමී තෙරුන් වහන්සේ D රේවත තෙරුන් වහන්සේ
E සානවාසී සාම්භූත තෙරුන් වහන්සේ F සාළ්හ තෙරුන් වහන්සේ

මේ රහත් භික්ෂූන් වහන්සේලා අතරින් පාචීනක (පෙරදිග) දිසාව නියෝජනය කරනු ලැබුයේ,

(1) A, B, Dවල සඳහන් රහතන් වහන්සේලා ය.
(2) A, B, Cවල සඳහන් රහතන් වහන්සේලා ය.
(3) A, C, Dවල සඳහන් රහතන් වහන්සේලා ය.
(4) C, D, Eවල සඳහන් රහතන් වහන්සේලා ය.
(5) B, C, Fවල සඳහන් රහතන් වහන්සේලා ය.

36. ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ලැයිස්තුවට ඇතුළත් නොවන්නේ මින් කුමක් ද?

(1) ධර්ම විනය ආරක්ෂාකරලීම සඳහා භාණක තෙරවරුන් පත්කිරීම.
(2) බුදු රජාණන් වහන්සේ පනවන ලද විනය නීති වෙනස් නොකිරීමට සංගීතිකාරක හිමිවරු සම්මතයකට පැමිණීම.
(3) විසිරී පැවැති ධර්මය හා විනය ඒකරාශී කොට ආරක්ෂාකිරීමට යොමුවීම.
(4) බුද්ධ නියමයට අනුව ඡන්න හිමියන්ට බ්‍රහ්ම දණ්ඩනය පැනවීමට තීරණය කිරීම.
(5) විනය ශාසනයේ ආයුෂය ලෙස සලකා පළමුවෙන් විනය සංගායනා කිරීමට තීරණය කිරීම.

37. මිනිස් ඝාතන නිසා දැඩි කම්පාවට හා කලකිරීමට පත් අශෝක දික් විජය අතහැර ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කරන්නට පෙළඹුණු අයුරු.......................... දක්වා ඇත.

(1) කාල්සි ගිරි ලිපියේ (2) ගිරිනාර් 3වන ලිපියේ (3) 13වන ගිරිලිපියේ
(4) ගිරිනාර් 7වන ලිපියේ (5) බහිරාට් ගිරි ලිපියේ

38. මහායාන බුදු සමයට සම්බන්ධ වියත් මහපඬිවරුන් කිහිපදෙනෙකුගේ නම් පහත දැක්වේ.

**A** වසුමිත්‍ර හිමි **B** පාර්ශ්ව හිමි **C** නාගර්ජුන හිමි
**D** අශ්වඝෝෂ හිමි **E** බෝධි ධර්ම හිමි

මේ හිමිවරුන් අතරින් කණිෂ්ක රජතුමාගේ රාජ සභාව නියෝජනය කරන හිමිවරු ඇතුළත් වනුයේ,

(1) **A**වල පමණි. (2) **A** සහ **B**වල පමණි. (3) **A B** සහ **C**වල පමණි.
(4) **A B C** සහ **D**වල පමණි. (5) **A B C D** සහ **E** යන සියල්ල ම ය.

39. ක්‍රි. ව. 983 - 995 අතර කාලය තුළ වික්‍රමශිලා විශ්වවිද්‍යාලයේ ද්වාරපණ්ඩිතවරුන් ලෙස සේවය කළ අයගෙන් ප්‍රඥාකරමති පඬිතුමන්ට භාරවූයේ,

(1) පෙරදිග දොරටුව (2) උතුරු දොරටුව (3) පළමුවන දොරටුව

(4) බටහිර දොරටුව (5) දකුණු දොරටුව

40. පණ්ඩුකාභය රජතුමා .......................... උදෙසා රජ ගෙවුයන ඇතුළත දෙවොලක් කරදුන් බව වාර්තා වේ.

(1) කාලවේල යක්ෂයා (2) චිත්තරාජ යක්ෂයා (3) පශ්චිම රාජිනී යක්ෂණිය

(4) වළවාමුඛී යක්ෂණිය (5) ජුතින්ධර යක්ෂයා

41. අනුරාධපුර යුගයේ ප්‍රධාන වෙහෙර - විහාර මුල්කරගනිමින් විවිධ බෞද්ධ උත්සව පුද පූජා ආරම්භ විය. කිත්සිරිමෙවන් රජු කල දළ දා පූජාව ආරම්භ වූයේ,

(1) මහා විහාරය මුල්කරගෙන ය. (2) අභයගිරි විහාරය මුල්කරගෙන ය.

(3) චේතියගිරි විහාරය මුල්කරගෙන ය. (4) ජේතවන විහාරය මුල්කරගෙන ය.

(5) දක්ඛිණගිරි විහාරය මුල්කරගෙන ය.

42. ශාසන මාමකත්වය, දන්දීම, වැඩිහිටියන්ට සැලකීම, පරෝපකාරය, අවිහිංසාව, ග්ලානෝපස්ථානය යනාදී උතුම් සමාජ ධර්ම අපේ පැරණි ජන සමාජයේ ශ්‍රේෂ්ඨත්වය විදහාපාන ලක්ෂණයන් වේ. මේ සමාජ ධර්ම තුළ දක්නට ලැබෙන **අත්තම් ක්‍රමය** යනුවෙන් අදහස් කෙරෙනුයේ,

(1) ආගන්තුක සත්කාරය යි. (2) ඇඳුම් මැසීමට අදාළ නූල් සැකසීම යි.

(3) ශ්‍රමය සාමූහික ව බෙදාගෙන ක්‍රියාකිරීම යි. (4) රෝගී වූවන්ට උපස්ථාන කිරීම යි.

(5) වැඩිහිටියන්ගේ අවවාද අනුශාසනාවලට ඇහුම්කන් දීම යි.

43. බුරුමයට ස්ථිර වශයෙන් බුදුදහම ලැබී එය තහවුරු වූ කාලය වශයෙන් සැලකෙන්නේ,

(1) ක්‍රි.ව. 08වන සියවසේ දී ය. (2) ක්‍රි.ව. 09වන සියවසේ දී ය. (3) ක්‍රි.ව. 10වන සියවසේ දී ය.

(4) ක්‍රි.ව. 11වන සියවසේ දී ය. (5) ක්‍රි.ව. 12වන සියවසේ දී ය.

44. චීනයේ මාධ්‍යමික සම්ප්‍රදායේ ගුරුවරයා ලෙස සැලකෙනුයේ කුමාරජීව පඬිවරයා ය. එතුමාගේ සංස්කෘත හා චීන භාෂාව පිළිබඳ හසල දැනුම එරට බුදු දහමේ ව්‍යාප්තිය සඳහා මහඟු පිටුවහලක් විය. එතුමන් විසින් විශාල ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කළ අතර, ඇතැම් ඒවා චීන බසට පරිවර්තනය කොට ඇත. එසේ පරිවර්තනය කළ කෘතීන් අතර සුවිශේෂී කෘතියක් වන්නේ,

(1) අභිධර්මකෝෂ ව්‍යාඛ්‍යා ශාස්ත්‍රය (2) අෂ්ටාදශ ශූන්‍යතා ශාස්ත්‍රය (3) මහා රත්නකූට සූත්‍රය

(4) සන්ධි නිර්මෝචන සූත්‍රය (5) සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය

45. ථායිලන්තයේ ශාසන ඉතිහාසය සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) මොන්කුත් රාජ්‍ය සමය වන විට ථායිලන්තයේ පැවැතියේ සියම් නිකාය පමණි.

(2) සූර්ය වංශික රාම රජතුමා ක්‍රි.ව. 1361 දී සියම් භික්ෂු පිරිසක් භාරතයට යවා බුදුදහම ඉගෙනීමට සැලසීම.

(3) ක්‍රි. ව. 7 සියවසේ හංසවතී හා පේගු යන රාජ්‍යවල බුදුසමය සමෘද්ධමත්ව පැවැතීම.

(4) ථෙරවාදී බුදුසමයේ දෙවන උදාව ඇතිවන්නේ පලම්භාන් රාජ්‍ය වකවානුවේ ය.

(5) ථෙරවාදී බුදුසමයේ තෙවන උදාව ඇතිවන්නේ ශ්‍රී ලාංකික භික්ෂු පිරිසක් ථායිලන්තයට බුදුසමය රැගෙන යාමත් සමග ය.

46. ජපන් බෞද්ධ ඉතිහාසය මූලික වශයෙන් නරා, හෙයියන්, කමාකුරා හා මෙයිජි වශයෙන් යුග කිහිපයකට බෙදීමකට ලක්කොට බුදු දහමේ පරිවර්තනීය ලක්ෂණ සාකච්ඡා කෙරේ. ඒ අනුව නරා යුගයේ පරිවර්තනීය ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද?

(1) ගෙම්මෙයෝ අධිරාජිනිය විසින් නරා ප්‍රදේශය අගනුවර කරගනු ලැබීම.

(2) ග්යෝගි භික්ෂුවගේ සේවාව ඇගයීමට ලක් වීම.

(3) සෙන් බුදු සමය නරා යුගයේ දී ජපානයට ලැබීම.

(4) නරා යුගයේ බෞද්ධ සම්ප්‍රදායන් හයක් බුදු දහමට එකතු වීම.

(5) නරා යුගයේ වෛරෝචන බුද්ධ ප්‍රතිමාව නිර්මාණය වීම.

47. කණිෂ්ක රාජ්‍ය වකවානුව දක්වා බුද්ධ ප්‍රතිමා නිර්මාණය නො වූ බව බොහෝ විද්වතුන්ගේ මතය වේ. ඒ තාක් බෞද්ධ කලාකරුවා විවිධ සංකේත භාවිත කළ බවට සාක්ෂි සාංචි ස්තූපය ආශ්‍රිත කැටයම්වල දක්නට ලැබේ. මෙහි ලා බුදුරජාණන් වහන්සේ නිරූපණය කිරීමට යොදාගත් එක් සංකේතයක් වූයේ,

(1) වජ්‍රායුධය යි. (2) බෝ කොළය යි. (3) ඌර්ණරෝම ධාතුව යි.
(4) චීවරය යි. (5) වජ්‍රාසනය යි.

48. පහත දැක්වෙනුයේ සුවිශේෂී කලා නිර්මාණ පිහිටි ස්ථානයන් ය.

A මැදිරිගිරිය B කණ්ඨක චෛත්‍යය C රත්න ප්‍රාසාදය
D බිසෝමාළිගාව E නිල්ලක්කගම

එම ස්ථානයන්ට අදාළ කලාත්මක ම මුරගල, කලාත්මක ම වාහල්කඩ, කලාත්මක ම සඳකඩ පහණ, කලාත්මක ම බෝධිඝරය, කලාත්මක ම වටදාගෙය, පිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,

(1) A, B,C, D, E ය. (2) C ,B, E,D, A ය. (3) B, C, D,E,A ය.
(4) C, B, D, E, A ය. (5) B, C, E,A, D ය.

49. බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල පදනම් කරගෙන රචනා වූ ගීතයකි.

(1) සුගත ලෝනා සම්බුද්ධ රාජා ... (2) අමා දහර දිය ගලා ගලා ...
(3) අඩවන් වූ දෙනෙතින් ගලනා ... (4) දස බිම්බර මාරසෙනඟ ...
(5) පාරමිතා බල පූජිත පූජිත බුද්ධ දිවාකරයාණෝ ...

50. නූතන යුගයේ චිත්‍ර ශිල්පීන් අතර එම් සාර්ලිස් මහතාට ද සුවිශේෂී ස්ථානයක් හිමි වේ. ඔහුගේ සිතුවම් අතර දක්නට ලැබෙන ප්‍රමුඛ ලක්ෂණයක් වන්නේ,

(1) ඇස පිනවීමට මුල්තැනක් ලබා දී ඇති බව යි. (2) බටහිර තාත්වික සම්ප්‍රදාය අනුගමනය කිරීම යි.
(3) දේශීය සම්ප්‍රදායට මුල් තැනක් ලබා දීම යි. (4) ශෘංගාරය ඉස්මතු කොට දැක්වීම යි.
(5) වර්ණ භාවිතයේ දී නිල් සහ කොළ පාට අඩුවෙන් භාවිතයට ගැනීම යි.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

# බෞද්ධ ශිෂ්ටාචාරය - II

45 S II

කාලයඃ පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

විභාග අංකයඃ ......................................................

**උපදෙස් ඃ-**

* **i** කොටසින් ප්‍රශ්න දෙකක් ද **ii** කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් හිමි වේ.

## I කොටස

1. (i) ගෘහස්ථ ආශ්‍රමයට අයත් කාර්යයන් **හතරක්** නම් කරන්න. (ලකුණු 2යි.)

   ii) බ්‍රාහ්මණ යාගයෙහි නිරර්ථකත්වය ප්‍රකට කරන බෞද්ධ ඉගැන්වීම් **තුනක්** පෙන්වා දෙන්න. (ලකුණු 3යි.)

   (iii) බුද්ධ කාලීන භාරතය තුළ කෘෂි කර්මාන්තයට හිමි තැන සාධක **හතරක්** ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 4යි.)

   (iv) බෞද්ධ ඉගැන්වීම් තුළින් මවක් වශයෙන් කාන්තාව උත්තරීතර තත්ත්වයට පත්කොට ඇති අයුරු නිදසුන් **පහක්** මගින් ප්‍රකට කරන්න. (ලකුණු 5යි.)

   (v) මක්ඛලී ගෝසාලගේ ආගමික ඉගැන්වීම් තුළින් සමාජ සදාචාරයට සිදුවන **අහිතකර බලපෑම** විස්තර කරන්න. (ලකුණු 6යි.)

2. (i) බුදු රජාණන් වහන්සේ **සම්මා සම්බුද්ධ** නාමයෙන් හැඳින්වීමට හේතු වූ කරුණු දෙකක් නම් කරන්න. (ලකුණු 2යි.)

   (ii) බුදු රජාණන් වහන්සේගේ **පද්මාකාර ජීවිතය** හෙළිවන අවස්ථා තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 3යි.)

   (iii) බුදු රජාණන් වහන්සේගේ **මහාකාරුණිකත්වය** නිදසුන් හතරක් මගින් ප්‍රකට කරන්න. (ලකුණු 4යි.)

   (iv) සැරියුත් මහරහතන් වහන්සේ සතු ව පැවැති චරිත ලක්ෂණ පහක් ගෙන හැර දක්වන්න. (ලකුණු 5යි.)

   (v) සාමකාමී සමාජ පරිසරයක් ගොඩනගා ගැනීමට **අල්පේච්ඡතාව** උපකාරී වන අයුරු විස්තර කරන්න. (ලකුණු 6යි.)

3. (i) **"නිධීනංව පවත්තාරං... "** යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 2යි.)

(ii) එම ගාථාවේ අර්ථය නිවැරදි ව ලියන්න. (ලකුණු 3යි.)

(iii) ස්වාමි - භාර්යා යුතුකම් හා වගකීම් දහය සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න. (ලකුණු 4යි.)

(iv) ගුණගරුක සමාජයක් නිර්මාණය කර ගැනීමෙහි ලා **" මාතා පිතු උපට්ඨානං "** යන සූත්‍රපාඨයෙහි ඇතුළත් මංගල කරුණු උපකාරී වන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 5යි)

(v) සුරාපානයෙන් වැළකීම පුද්ගල හා සමාජ අභිවෘද්ධියට හේතුවන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 5යි.)

## ii කොටස

4. (i) දේශපාලනයට අදාළ බෞද්ධ ඉගැන්වීම්හි ඇතුළත් **දසරාජ ධර්ම** හා **සප්ත අපරිහානීය ධර්මවල** ප්‍රායෝගික වැදගත්කම ඇගයීමට ලක්කරන්න. (ලකුණු 10යි.)

(ii) වත්මන් සමාජය මුහුණ දෙන බොහෝ ගැටලු අවම කරගැනීමට **දස කුසල්** උපකාරීවන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

5. (i) **පුද්ගල ස්වාමීත්වය හා ස්වච්ඡන්දතාව** පිළිබඳ බුද්ධකාලීන ඉගැන්වීම් තුළින් බෞද්ධ ඉගැන්වීම් වෙනස් වන්නේ කෙසේදැ'යි විමසීමට ලක් කරන්න. (ලකුණු 10යි.)

(ii) **ශ්‍රද්ධාව** පිළිබඳ හැඳින්වීමක් කොට එය පුද්ගලයාගේ ආධ්‍යාත්මික දියුණුව උදාකරලීමට ඉවහල් වන අයුරු විවරණය කරන්න. (ලකුණු10යි.)

6. (i) ධනෝපායනය හා ධන **පරිහරණයට** අදාළ බෞද්ධ ඉගැන්වීම් ආර්ථික සුරක්ෂිතතාව උදාකරලීමට හේතුවන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

(ii) තෙවන ධර්ම සංගායනාව හා අශෝක රජතුමාගේ ශාසනික සේවය බුදු **දහමේ චිරස්ථිතියට** හා **ව්‍යාප්තියට** හේතු වූ අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

7. (i) ශ්‍රී ලාංකේය **සමාජ ධර්ම** බුදු දහමින් හැඩ ගැසුණු අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

(ii) **"අභයගිරි විහාරයේ ආරම්භය මෙරට ආගමික හා සංස්කෘතික පරිවර්තනයක් උදාකරලීමට හේතු විය."** විමසන්න. (ලකුණු 10යි.)

8. (i) **ජපානයට** බුදු දහම ලැබුණ ආකාරය හා එරට **සංස්කෘතිය** බුදු **දහමින් පෝෂණය** වූ ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

(ii) **ස්තූපයේ ආරම්භය** පිළිබඳ පැහැදිලි කොට එය **ලක්දිව දී විකාශය** වූ අයුරු විස්තර කරන්න.

(ලකුණු 10යි.)

***